**මලෛයහම් 200 පිළිගැනීම සහ ප්‍රතිපූරණ ක්‍රියාමාර්ග ඉල්ලා සිටින ප්‍රකාශය**

2023 අගෝස්තු 11 වන දින.

මලෛයහ දෙමළ ජනතාව දකුණු ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණ මේ වසරට වර්ෂ 200ක් සපිරේ. මෙම සංවත්සරය වූ කලී 2023 ජූලි 27 සිට අගෝස්තු 12 දක්වා තලෙයිමන්නාරමේ සිට මාතලේ දක්වා පැවැත්වෙන '*මාන්ඹුමිගු මලෛයහ මක්කල්*' පාගමනද ඇතුළුව එකී ප්‍රජාව තුළ සහ ඉන් පිටත සිවිල් සමාජ, ආගමික සහ දේශපාලන සංවිධාන ගණනාවක් විසින් සමරනු ලැබ ඇත. මෙම සමරු උත්සව හරහා එකී ප්‍රජාව විසින් විඳි දුක්වේදනා සහ මේ රටේ සමානාත්මතාවයෙන් යුත් පුරවැසියන් ලෙස සම ස්ථානයක් හිමිකර ගැනීමට ඔවුන් කළ අරගලය සිහිපත් කිරීමට උත්සාහ කරනු ලබන අතරම ඔවුන්ගේ ඉතිහාසය සම්බන්ධයෙන් නිසිලෙස පිළිගැනීමට සහ අසාධාරණයන් හඳුනාගැනීම සිදුකරන ලෙසට ඉල්ලාසිටී. මෙම ලේඛණයට පහත අත්සන්කර ඇති අප විසින්, එකී ප්‍රජාවට සිදුවූ අගතීන් සම්බන්ධයෙන් හානිපූරණය කිරීමට අවැසි ක්‍රියාමාර්ග ගන්නා ලෙස මලෛයහම් දෙමළ ප්‍රජාව විසින් ශ්‍රී ලංකා රජයට කරන ඉල්ලීම් යලි ප්‍රතිරාවය කරන්නෙමු.

මලෛයහ දෙමළ ජනයා සම්බන්ධයෙන් වන ව්‍යුහාත්මක වශයෙන් සිදු කෙරෙන වෙනස්කොට සැලකීම් වූ කලී දශක ගණනාවක් පුරාවට ජාතික න්‍යාය පත්‍රය තුළ නොසලකා හැර ඇති ප්‍රශ්නයකි. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනය යටතේ සහ නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ ඔවුන්ට සැලකීම, 1948දී ඔවුන්ගේ ඡන්ද අයිතිය අහිමි කිරීම ඇතුළුව, අසමානතාව, අයිතිවාසිකම් අහිමිකිරීම් සහ අනාරක්ෂිත තත්ත්වයට පත්කිරීමේ ක්‍රමවේදයක් නිර්මාණය කරන ලදී. ඔවුන්ගේ ශ්‍රමය වූ කලී මේ රටේ ආර්ථිකය ගොඩනගා ඇති ඉහළම ආදායම් ලබන ආර්ථික ක්ෂේත්‍රවලින් එකක් වුවද, ඊට දායකවන ප්‍රජාවේ සාමාජිකයන් රාජ්‍යයේ වඩාත්ම අඩු වරප්‍රසාද ලත් සහ අඩු පහසුකම් සහිත කොටසක් වශයෙන් සිටී. වසර ගණනාවක් පුරා ලබාදී ඇති විවිධ ආධාර යෝජනා ක්‍රම පිළිබඳව රජය සහ වැවිලි කර්මාන්තය මගින් පෙන්වාදෙනු ලැබුවද, සියලු සමාජ ආර්ථික දර්ශක අනුව වැවිලි ක්ෂේත්‍රය දිගින්දිගටම පසුගාමී තත්ත්වයක පවතින බව මනාව පිළිබිඹු වේ. වත්මන් ආර්ථික අර්බුදය තුළ මෙම ප්‍රජාව තුළ පවතින ඉහළ දරිද්‍රතාවයේ අනුපාත සම්බන්ධයෙන් වන ගැටලු ආමන්ත්‍රණය කිරීම සහන සැලසීමේ පියවරක් පමණක් නොව, පසුගිය දශකවල සිදු වූ වැරදි නිවැරදි කිරීමට අදාල ආර්ථික සාධාරණත්වය පිළිබඳ ප්‍රශ්නයකි.

ශ්‍රී ලංකාව නිදහස ලබා වසර 75ක් ගතවීම සහ කළු ජූලිය සිදුවීමෙන් පසු 40 වසරක කාලය ඇතුළුව ප්‍රධාන සංවත්සර ගණනාවක් සනිටුහන් කරනු ලබයි. මෙමගින් සියලුම පුරවැසියන්ට අතීතය සහ එහි බලපෑම ආවර්ජනය කිරීමටත්, ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතාව, බහුත්වවාදය, සාධාරණත්වය සහ යුක්තිය මත ගොඩනැගුණු අනාගතයක් යළි පරිකල්පනය කිරීමටත් අවස්ථාව සැලසේ. ශ්‍රී ලංකා රාජ්‍යය සඳහා, බලය බෙදාගැනීම සහ සංක්‍රාන්ති යුක්තිය ආමන්ත්‍රණය කිරීමේ මූලපිරීම් සාකච්ඡා කරනු ලබන විට, දුක්ගැනවිලි විසඳීමට සහ එහි අතීත ක්‍රියා සහ අසාර්ථකත්වයන් සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට වගකීමක් ඇත.

පහත අත්සන්කර ඇති අපි, ''*මාන්ඹුමිගු මලෙයෙහ මක්කල්,* තලෙයිමන්නාරමේ සිට මාතලේ දක්වා පාගමනේ'' ඉල්ලීම් අනුමත කරන්නෙමු. මූලික වශයෙන්ම, මෙම ඉල්ලීම් නියෝජනය කරනු ලබන්නේ ඔවුන්ගේ සුවිශේෂී අනන්‍යතාව පිළිගැනීම සහ සහතික කිරීමේ ක්‍රියාකාරීත්වයන්ය:

- ඔවුන්ගේ ඉතිහාසය, අරගල සහ දායකත්වයන් පිළිගැනීම
- පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ සුවිශේෂී ප්‍රජාවක් සහ ඡන්දදායක ප්‍රජාවක් වශයෙන් පිළිගැනීම
- සමානාත්මතාව සාක්ෂාත්කර ගැනීම සඳහා අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ පියවර පිළිබඳ සුවිශේෂී ධනාත්මක ක්‍රියාමාර්ග ගැනීම
- ජීවත්වීමට සරිලන වැටුපක්, ගෞරවනීය රැකියා ප්‍රමිතීන්, නෛතික ආරක්ෂාව සහ පිරිමි හා කාන්තා කම්කරුවන්ට සමාන වැටුප්
- නිවාස සහ ජීවනෝපාය සඳහා සුරක්ෂිත අයිතිවාසිකමක් සහිත ඉඩම්
- දෙමළ භාෂාව සමාන ලෙස භාවිතය සහ ඒ සඳහා සමාන තත්ත්වයක්
- රාජ්‍ය සේවාවන් සඳහා සමාන ප්‍රවේශයක්
- වතුකරයේ ජනාවාස නව ගම්මාන ලෙස සීමා නිර්ණය කිරීම
- ගෘහස්ථ සේවකයින් ආරක්ෂා කිරීම

මෙම ඉල්ලීම් ලැයිස්තුව සවිස්තරාත්මක හා පරිපූර්ණ නොවිය හැකි මුත්, නිසි පිළිගැනීම සහ යුක්තිය සඳහා පියවරක් වශයෙන් ක්‍රියාත්මක කරන ලෙස අප විසින් ඉල්ලා සිටින එකී ප්‍රජාවේ දිගුකාලීන ඉල්ලීම් කිහිපයක් එමගින් පිළිබිඹු කරයි. මෙම ඓතිහාසික දුක්ගැනවිලි නිවැරැදිකර ගැනීමට ස්වකීය දායකත්වය ලබාදෙන ලෙස සිංහල, දෙමළ, මුස්ලිම් ප්‍රජාවන්ගේ නායකයින්ගෙන්ද අපි ඉල්ලා සිටින්නෙමු.

<u>**පුද්ගලයන්**</u> <u>**සංවිධාන**</u>